සියලුම හිමිකම් ඇවිරිණි.

**අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, පෙරහුරු පරීක්ෂණය- 2025(2026)**

**ව්‍යවසායකත්ව අධ්‍යයනය I, II**

**63 S I,II**

**පැය තුනයි**

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි.**

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනිමටත් යොදාගන්න.**

## ව්‍යවසායකත්ව අධ්‍යයනය I

උපදෙස්:

- **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3),(4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගන්න.
- **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකය සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.**
- එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

1. ව්‍යවසායකත්වය යන්න වඩාත් පැහැදිලිව දැක්වෙන ප්‍රකාශය වන්නේ,
   (1) පුද්ගලයින්ගේ ධනාත්මක ආකල්ප, කුසලතා හා හැකියා පිළිබඳ එකතුවකි.
   (2) සහජයෙන් පමණක් පුද්ගලයෙකුට උරුම වන වටිනා චින්තනයකි.
   (3) නිර්මාණශීලීත්වය තුළින් නවෝත්පාදන බිහිකරන මිනිස් චින්තනය හා සම්බන්ධ ක්‍රියාවලියකි.
   (4) වෙනසක් ඇති කිරීමට පදනම් වන්නා වූ වටිනා චින්තනයකි.

2. නිෂ්පාදන සාධක පමණක් ඇතුළත් වරණය තෝරන්න.
   (1) පස, ශ්‍රමය, ප්‍රාග්ධනය, යන්ත්‍රසූත්‍ර
   (2) භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය, ව්‍යවසායකත්වය
   (3) ශ්‍රමය, අමුද්‍රව්‍ය, ඉඩම්, ව්‍යවසායකත්වය
   (4) භූමිය, ශ්‍රමය, යන්ත්‍රසූත්‍ර, වනාන්තර

3. ව්‍යවසායකයා විසින්,
   (1) නව්‍යතා සම්පාදනයේ නිරත වේ.
   (2) සාම්ප්‍රදායිකව කටයුතු කරනු ලබයි.
   (3) ඕනෑම අවදානමක් භාර ගනී.
   (4) ව්‍යාපාරික කටයුතුවල පමණක් නිරත වේ.

4. නිර්මාණශීලීත්වයට බාධාකාරී සාධකයක් වන්නේ,
   (1) තර්කානුකූල වීමයි.
   (2) වැරදීම් හා විවේචන සඳහා බිය නොවීමයි.
   (3) රීති හා සම්ප්‍රදාය අනවබෝධයෙන් පිළිපැදීමයි.
   (4) නීතිගරුක වීමයි.

5. කුරක්කන් පිටි භාවිතයෙන් බේකරි නිෂ්පාදන සැකසීම අයත් වනුයේ,
   (1) නව සොයා ගැනීමක් ලෙස ය.
   (2) දිගුවක් ලෙස ය.
   (3) අනුකරණය කිරීමක් ලෙස ය.
   (4) සංකලනයක් ලෙස ය.

6. ස්වාධීනත්වය යනු,
   (1) අරමුණු ඉටු කර ගැනීමට තාත්විකව කටයුතු කිරීම ය.
   (2) තම අභිමතය පරිදි වැඩ කිරීමට හැකි වීම ය.
   (3) වෙනස්වීම්වලට උචිත වන පරිදි අනුගත වීමට හැකි වීම ය.
   (4) පරාජයන්, බිඳ වැටීම් හමුවේ නොසැලී කටයුතු කිරීම ය.

7. "මම අසාර්ථක නොවූවෙමි. නමුත් විදුලි බුබුල ක්‍රියාවිරහිත විය හැකි අවස්ථා නවසිය අනූ නමයක් හඳුනා ගත්තෙමි." තෝමස් අල්වා එඩිසන්ගේ මෙම ප්‍රකාශයෙන් අදහස් වන ව්‍යවසායකත්ව ගති ලක්ෂණය වන්නේ,
   (1) සුභවාදී බවයි.
   (2) නම්‍යශීලීත්වයයි.
   (3) අසීරු අරමුණු ඉටු කර ගැනීම කෙරෙහි ඇති නැඹුරුවයි.
   (4) ස්වකීය සාර්ථකත්වය තමා අනුව තීරණය වන බවට ඇති විශ්වාසයයි.

8. මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරාලීම සඳහා භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම, බෙදා හැරීම හා සම්බන්ධ වූ සියලුම කටයුතුවල නියැලී සිටින පුද්ගලයා,

(1) ව්‍යවසායකයෙකි. (2) අයිතිකරුවෙකි.
(3) ව්‍යාපාරිකයෙකි. (4) කළමනාකරුවෙකි.

9. X තීරුවේ සඳහන් සංකල්ප අනුපිළිවෙල අනුව Y තීරුවේ දැක්වෙන ලක්ෂණ ගැලපූ විට නිවැරදි පිළිතුර කුමක්ද?

| X තීරුව | Y තීරුව |
|---|---|
| අවශ්‍යතා | a. ස්පෘශ්‍ය වේ. |
| වුවමනා | b. මූලිකව පැන නඟියි. |
| භාණ්ඩ | c. අස්පෘශ්‍ය වේ. |
| සේවා | d. එක් එක් අයගේ පෞද්ගලිකත්වය අනුව තීරණය වේ. |

(1) b, a, c, d (2) b, c, a, d
(3) b, d, c, a (4) b, d, a, c

10. ප්‍රකාශ කිහිපයක් පහත දක්වා ඇත.

A. ආර්ථික කටයුත්තක නිරත වීම.
B. අවදානම් භාර ගැනීමට කැමැත්තක් නොදැක්වීම.
C. පවතින සම්පත් වලින් වුවද උපරිම ප්‍රයෝජන නොගැනීම.
D. පැවැත්ම ගැන සිතීම.

ඉහත සඳහන් ප්‍රකාශ අතරින් ව්‍යාපාරිකයා හා ව්‍යවසායකයා අතර සමානකම් වන්නේ,

(1) A පමණි. (2) A, C හා D පමණි.
(3) A හා D පමණි. (4) B හා D පමණි.

11. කසුන් කුඩා පරිමාණ ව්‍යාපාරිකයෙකි. ඔහුගේ ව්‍යාපාරය තුළ දැකිය හැකි ලක්ෂණයක් වනුයේ,

(1) ව්‍යාපාරය පවත්වා ගෙන යාමේ දී තීරණ ගැනීමට ඇති අපහසුවයි.
(2) ව්‍යාපාර කටයුතු ප්‍රදේශ කිහිපයක ව්‍යාප්ත වී තිබීමයි.
(3) කුඩා ප්‍රාග්ධනයකින් ආරම්භ කළ හැකි වීමය.
(4) වැඩි සේවක සංඛ්‍යාවක් සිටීමයි.

12. කුඩා පරිමාණ ව්‍යාපාර ආශ්‍රිතව දැකිය හැකි ශක්තියකි,

(1) සේවකයන් බඳවා ගැනීම හා පුහුණු කිරීම අපහසු වීම ය.
(2) ගතික පරිසරයට ක්ෂණිකව ප්‍රතිචාර දැක්වීම අපහසු වීම ය.
(3) පරිසර වෙනස්වීම්වලට පහසුවෙන් අනුගත වීමට හැකි වීම ය.
(4) සේවයේ නියුතු සේවක පිරිස් වැඩි වරප්‍රසාද අපේක්ෂා කිරීම ය.

13. සුනිල් තම ව්‍යාපාරයේ අරමුණු හා පරමාර්ථ ළඟා කර ගැනීම පිණිස අවශ්‍ය සම්පත් සපයමින්, අවධානම් දරමින්, වැදගත් තීරණ ගනිමින් කටයුතු කරයි. ඔහුගේ මෙම භූමිකාව හැඳින්විය හැක්කේ,

(1) කළමනාකරු ලෙස ය. (2) නායකයා ලෙස ය.
(3) අයිතිකරු ලෙස ය. (4) ව්‍යාපාරිකයා ලෙස ය.

14. විධිමත් පටිපාටියක් අනුගමනය කොට වඩා හොඳ සේවකයෙකු බඳවා ගැනීමට ව්‍යවසායකයකුට ඇති හැකියාව අයත් වනුයේ,

(1) සංකල්පනාත්මක කුසලතාවයට ය. (2) තාක්ෂණික කුසලතාවයට ය.
(3) උපදේශන කුසලතාවයට ය. (4) මානව කුසලතාවයට ය.

15. පහත සඳහන් දෑ අතරින් නූතන ව්‍යාපාර පරිසරයෙහි ලක්ෂණ දැක්වෙන පිළිතුර කුමක්ද?

a. අවශ්‍යතා හා වුවමනා සංකීර්ණ වී ඇත.
b. පාරිභෝගිකයින් බලවත් වී ඇත.
c. ලාභය ප්‍රධාන අරමුණ වී ඇත.
d. වෙනස් වීමේ වේගය අඩු වී ඇත.

(1) a හා b (2) a, b හා c (3) a, b, c හා d (4) a හා c

16. ව්‍යාපාර අභ්‍යන්තර පරිසරයට අයත් සාධක වන්නේ,

(1) අයිතිකරුවන්, කළමනාකරුවන්, සැපයුම්කරුවන් හා සම්පත් ය.
(2) තරඟකරුවන්, කළමනාකරුවන්, සම්පත් හා සැපයුම්කරුවන් ය.
(3) අයිතිකරුවන්, කළමනාකරුවන්, සේවකයින් හා සම්පත් ය.
(4) ගනුදෙනුකරුවන්, සම්පත්, කළමනාකරුවන් හා තරඟකරුවන් ය.

17. ශ්‍රී ලංකා ආර්ථිකයේ ප්‍රධාන ව්‍යාපාර අංශ වන්නේ,

(1) කෘෂි, ධීවර හා සේවා
(2) ප්‍රාථමික, ද්විතියික හා තෘතියික
(3) කුඩා පරිමාණ, මධ්‍ය පරිමාණ හා මහා පරිමාණ
(4) නිෂ්පාදන, වෙළෙඳ හා සේවා

18. අන්තර්ජාතික වෙළෙඳපොලට පිවිසීමට ඇති ඉඩකඩ වැඩි වීම අයත් වන්නේ,

(1) බාහිර පරිසරයට ය.
(2) දේශපාලන පරිසරයට ය.
(3) ගෝලීය පරිසරයට ය.
(4) ආර්ථික පරිසරයට ය.

19. බාහිර පරිසර සාධක පමණක් ඇතුළත් වරණය කුමක්ද?

(1) යන්ත්‍ර සූත්‍ර, මිල මට්ටම, සේවා නියුක්තිය
(2) ගනුදෙනුකරුවන්, මිල මට්ටම, රාජ්‍ය ප්‍රතිපත්ති
(3) මුදල්, නීතිරීති, පොළී අනුපාතික
(4) තරඟකරුවන්, ගොඩනැගිලි, පොළී අනුපාතික

20. පහත සඳහන් X තීරුවේ ඇති ව්‍යාපාර සඳහා උචිත ස්ථානය Y තීරුවෙන් නිවැරදිව තෝරා ඇති වරණය කුමක්ද?

| x | Y |
|---|---|
| 1. තොග ගබඩාවක් | A. වාහන නවතා තැබීමට ඉඩ ඇති හා මාර්ග පහසුකම් ඇති ස්ථානයක් |
| 2. රෙදි සාප්පුවක් | B. මාර්ග පහසුකම් සහිත නිසල පරිසරයක පිහිටි සුන්දර ස්ථානයක් |
| 3. පාසැල් උපකරණ හා ලිපිද්‍රව්‍ය අලෙවි සැලක් | C. ප්‍රදර්ශනය සඳහා ඉඩකඩ ඇති ජනාකීර්ණ ස්ථානයක් |
| 4. උත්සව ශාලාවක් | D. පාසැල් ආසන්න පරිසරයක් |

(1) A, B, C, D
(2) A, C, B, D
(3) A, C, D, B
(4) C, A, D, B

21. සෙනෙහස් යනු තරුණ ව්‍යවසායකයෙකු වන අතර ඔහු කොළඹ ප්‍රදේශයේ කේබල් කාර් ප්‍රවාහන සේවාවක් ආරම්භ කිරීමට බලාපොරොත්තු වේ. ඔහු වෙළෙඳපොලට ප්‍රවේශ වීම සිදු වන්නේ,

(1) පවතින භාණ්ඩයක් හෝ සේවාවක් පවතින වෙළෙඳපොලට ඉදිරිපත් කිරීමක් ලෙස ය.
(2) පවතින භාණ්ඩයක් හෝ සේවාවක් නව වෙළෙඳපොලට ඉදිරිපත් කිරීමක් ලෙස ය.
(3) නව භාණ්ඩයක් හෝ සේවාවක් පවතින වෙළෙඳපොලට ඉදිරිපත් කිරීමක් ලෙස ය.
(4) නව භාණ්ඩයක් හෝ සේවාවක් නව වෙළෙඳපොලට ඉදිරිපත් කිරීමක් ලෙස ය.

22. ප්‍රකාශ කිහිපයක් පහත දක්වා ඇත.

A. පේටන්ට් බලපත්‍රයේ වලංගු කාලය අවුරුදු 20 කි.
B. පේටන්ට් බලපත්‍රය විකිණිය හැක.
C. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් නිකුත් කරනු ලබයි.
D. නිෂ්පාදනය කරන ඕනෑම නිෂ්පාදිතයක් සඳහා ලබා ගත හැක.

ඉහත ප්‍රකාශ අතුරින් පේටන්ට් බලපත්‍රය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශ පමණක් ඇතුළත් පිළිතුර කුමක්ද?

(1) A හා C.
(2) B හා C.
(3) A හා B.
(4) C හා D.

23. තෝරා ගනු ලබන ව්‍යාපාර අදහස් ගැඹුරින් අධ්‍යයනය කිරීම සිදු වන්නේ,

(1) සාර්ව විශ්ලේෂණයේදී ය.
(2) සූක්ෂම විශ්ලේෂණයේදී ය.
(3) ශදුඅත විශ්ලේෂණයේදී ය.
(4) වෙළෙඳපොල විශ්ලේෂණයේදී ය.

24. ව්‍යාපාරයේ නම, අයත්වන කර්මාන්ත ක්ෂේත්‍රය, සැලැස්ම සකස් කිරීමේ අරමුණු හා පරමාර්ථ සංක්ෂිප්තව ඇතුලත් වන, ව්‍යාපාර සැලැස්මෙහි මූලිකාංගය වන්නේ,

(1) මූල්‍ය සැලැස්මයි.
(2) පරිපාලන සාරාංශයයි.
(3) සංවිධාන සැලැස්මයි.
(4) විධායක සාරාංශයයි.

25. ව්‍යාපාර සැලැස්මක අන්තර්ගත තොරතුරු මඟින්,

(1) අතීත තොරතුරු විශ්ලේෂණය කරයි.
(2) අතීත සහ වර්තමාන තොරතුරු සංසන්දනය කරයි.
(3) අනාගත තොරතුරු පුරෝකථනය කරයි.
(4) වර්තමාන තත්ත්වය විග්‍රහ කරයි.

26. ව්‍යාපාරයක් ආරම්භ කිරීමට පෙර ව්‍යාපාර කාර්යයන්ට අවශ්‍යවන භෞතික හා මානව සම්පත් හඳුනාගනු ලබන්නේ,

(1) පරිපාලන සැලැස්ම මඟිනි.
(2) ව්‍යාපාර සැලැස්ම මඟිනි.
(3) ආයෝජන ඇස්තමේන්තුව මඟිනි.
(4) නිෂ්පාදන සැලැස්ම මඟිනි.

27. නව ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ දී තරඟකරුවන් සහ ඉලක්කගත පාරිභෝගිකයන් පිළිබඳ සොයා බැලීම සඳහා පිළියෙල කරනු ලබන්නේ,

(1) වෙළෙඳපොළ විශ්ලේෂණයයි.
(2) සැපයුම් විශ්ලේෂණයයි.
(3) අලෙවි විශ්ලේෂණයයි.
(4) විකුණුම් විශ්ලේෂණයයි.

28. ව්‍යාපාරයක අපේක්ෂිත විකුණුම් ආදායම නිවැරදිව ගණනය කරනු ලබන්නේ පහත කවර වරණය මඟින්ද?

(1) භාණ්ඩ හෝ සේවා විකුණුම් ඒකක ප්‍රමාණය × ඒකකයක විකුණුම් මිල
(2) අපේක්ෂිත භාණ්ඩ හෝ සේවා විකුණුම් ඒකක ප්‍රමාණය × අපේක්ෂිත ඒකකයක විකුණුම් මිල
(3) $\frac{\text{භාණ්ඩ හෝ සේවා විකුණුම් ඒකක ප්‍රමාණය}}{\text{ඒකකයක විකුණුම් මිල}}$
(4) $\frac{\text{අපේක්ෂිත භාණ්ඩ හෝ සේවා විකුණුම් ඒකක ප්‍රමාණය}}{\text{අපේක්ෂිත ඒකකයක විකුණුම් මිල}}$

29. නිෂ්පාදිතයක් සඳහා ඇති සමස්ත ඉල්ලුමෙන් තෘප්තිමත් නොවූ පාරිභෝගික කොටස හඳුන්වනුයේ,

(1) අපේක්ෂිත ඉල්ලුම ලෙස ය.
(2) සමස්ත ඉල්ලුම ලෙස ය.
(3) වෙළෙඳපොළ කොටස ලෙස ය.
(4) වෙළෙඳපොළ හිඩැස ලෙස ය.

30. නිෂ්පාදන පිරිවැය ගණනය කිරීමේ දී සලකා බලනු ලබන පිරිවැයයන් පමණක් නිවැරදිව ඇතුළත් වරණය කුමක්ද?

(1) ද්‍රව්‍ය පිරිවැය, මූල්‍ය පිරිවැය හා අලෙවි පිරිවැය
(2) ද්‍රව්‍ය පිරිවැය, ශ්‍රම පිරිවැය හා මූල්‍ය පිරිවැය
(3) ද්‍රව්‍ය පිරිවැය, ශ්‍රම පිරිවැය හා වෙනත් පිරිවැය
(4) ද්‍රව්‍ය පිරිවැය, මූල්‍ය පිරිවැය හා වෙනත් පිරිවැය

31. සිමෙන්ති ගල් නිෂ්පාදන ව්‍යාපාරයක, සිමෙන්ති ගල් නිෂ්පාදන යන්ත්‍රයෙහි නඩත්තු වියදම අයත් වන්නේ,

(1) පරිපාලන පිරිවැයට වේ.
(2) වෙනත් පිරිවැයට වේ.
(3) මූල්‍ය පිරිවැයට වේ.
(4) අලෙවි පිරිවැයට වේ.

32. ව්‍යාපාරයක සංවිධාන ව්‍යුහයට අයත් තනතුරුවලට අදාළ කාර්යයන්, වගකීම් සහ සුදුසුකම් ඇතුලත් සැලසුම වන්නේ,

(1) විධායක සැලැස්ම යි.
(2) සංවිධාන සැලැස්ම යි.
(3) පරිපාලන සැලැස්ම යි.
(4) අලෙවි සැලැස්ම යි.

33. ව්‍යාපාර කටයුතු දෛනිකව පවත්වාගෙන යාමට අවශ්‍යවන මූලික අරමුදල හඳුන්වනු ලබන්නේ,

(1) ආයෝජන අරමුදල ලෙස ය.
(2) ආයෝජිත ප්‍රාග්ධනය ලෙස ය.
(3) මුළු ආයෝජනය ලෙස ය.
(4) කාරක ප්‍රාග්ධනය ලෙස ය.

34. නිමල් පොල්කටු අඟුරු නිෂ්පාදන ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අපේක්ෂා කරයි. එම ව්‍යාපාරය ලියාපදිංචි කිරීම සඳහා අවශ්‍ය විශේෂ බලපත්‍රය ලබා ගත යුතු වන්නේ,

(1) ශ්‍රී ලංකා මධ්‍යම පරිසර අධිකාරියෙනි.
(2) භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශයෙනි.
(3) ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙනි.
(4) ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයෙනි.

35. කේවල/හවුල් ව්‍යාපාරයක ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීමේ සහතිකය නිකුත් කරනුයේ,

(1) සමාගම් රෙජිස්ට්‍රාර්වරයා ය.
(2) ග්‍රාම නිලධාරිවරයා ය.
(3) පළාත් සභා ලේකම්වරයා ය.
(4) ප්‍රාදේශීය ලේකම්වරයා ය.

36. සමාගමේ පරමාර්ථ, කොටස් හිමියන්ගේ බැඳීම් හා අයිතිවාසිකම් යන තොරතුරු ඇතුළත් ලියවිල්ල වනුයේ,

(1) සංස්ථාපන සහතිකය යි.
(2) වෙළෙඳ සහතිකය යි.
(3) සාංගමික ව්‍යවස්ථාවලිය යි.
(4) සාංගමික සංස්ථා පත්‍රය යි.

37. හවුල් ව්‍යාපාරයක ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීම සිදු කරනුයේ,

(1) 1890 හවුල් ව්‍යාපාර ආඥා පනත මඟින් ය.
(2) 1840 අංක 07 දරණ වංචා වැළැක්වීමේ ආඥා පනත මඟින් ය.
(3) 1918 අංක 06 දරණ ව්‍යාපාර නාම ආඥා පනත මඟින් ය.
(4) 2007 අංක 07 දරණ සමාගම් පනත මඟින් ය.

38. හවුල් ඔප්පුවක් යනු,

(1) හවුල් ව්‍යාපාරයේ කටයුතුවලට අදාළ කොන්දේසි සහ නියමයන් ඇතුලත් ලියවිල්ලයි.
(2) හවුල් ව්‍යාපාරය ලියාපදිංචි කළ බව තහවුරු කරන ලියවිල්ලයි.
(3) හවුල්කරුවන් අතර ලාභාලාභ බෙදා ගැනීම පිළිබඳ ලියවිල්ලයි.
(4) හවුල්කරුවන්ගේ හිමිකම් දක්වන ලියවිල්ලයි.

39. ව්‍යවසායකත්ව සංස්කෘතියක් බිහිවීම සඳහා හිතකර සාධකයක් වන්නේ,

(1) ගතානුගතිකව සිතීමේ නැඹියාවයි.
(2) කෙටිකාලීනව රාජ්‍ය ප්‍රතිපත්ති වෙනස්වීමයි.
(3) වැටුප් ලබන රැකියාවන් සඳහා ඇති ඉහළ පිළිගැනීමයි.
(4) ස්ථාවර ආර්ථික පරිසරයක් පැවතීමයි.

40. ව්‍යාපාර ආචාරධර්ම තීරණය වීමෙහිලා බලපෑම් ඇති කරන පාර්ශ්ව පමණක් නිවැරදිව ඇතුළත් පිළිතුර කුමක්ද ?

(1) ව්‍යාපාර ආරම්භ කරන්නන්, සේවකයන්, රජය
(2) ව්‍යාපාර ආරම්භ කරන්නන්, ආයතනික සාමාජිකයින්, බාහිර සමාජය
(3) ව්‍යාපාර ආරම්භ කරන්නන්, කළමනාකරුවන්, රජය
(4) ව්‍යාපාර ආරම්භ කරන්නන්, රජය, බාහිර සමාජය

සියලු ම හිමිකම් ඇවිරිණි.

**අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය**
**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, පෙරහුරු පරීක්ෂණය- 2025(2026)**

**ව්‍යවසායකත්ව අධ්‍යයනය I, II**

**63 | S | I,II**

## ව්‍යවසායකත්ව අධ්‍යයනය II

❖ **පළමුවන** ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

1. පහත දී ඇති සිද්ධිය හොඳින් කියවා **(i)** සිට **(x)** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ගොඩනැගිලි ඉදිකිරීම් ව්‍යාපාර ක්ෂේත්‍රයේ කීර්තිනාමයක් දිනූ සමරසිංහ මහතාගේ පුත්‍රයා වන කලණ ව්‍යාපාර කළමනාකරණවේදී උපාධිධාරියෙකි. කුඩා කල සිටම නිර්මාණශීලී දරුවකු වූ හෙතෙම අනාගතයේ සාර්ථක ව්‍යවසායකයෙකු වීමට දැඩි ආශාව, කැපවීම හා ආත්ම විශ්වාසයෙන් යුතු විය.

නමුත් කලණගේ පියා ව්‍යාපාරික අත්දැකීම් බහුල වුවද, සැලසුම් සකස් කිරීම හා ලිඛිත තොරතුරු තබා ගැනීමට දැඩි අකමැත්තක් දැක්වීය. පියාගේ ඇරයුමෙන් ඇතුරුම් ගල් නිෂ්පාදනය සිදු කරන 'කලණ එන්ටප්‍රයිසස්' ආයතනයේ හිමිකාරීත්වය කලණට පැවරුණි. ව්‍යාපාර කටයුතු ආරම්භ කිරීමට පෙර කලණ ව්‍යාපාර පරිසරය පිළිබඳ විශ්ලේෂණයක් සිදු කරන ලද අතර ලබාගත් තොරතුරු මත පදනම්ව තම ව්‍යාපාරය සීමාසහිත පෞද්ගලික සමාගමක් බවට පත් කිරීමට තීරණය කරන ලදී.

i. ව්‍යවසායකයෙකු ලෙස කලණ තුළින් දැකිය හැකි ව්‍යවසායකත්ව ගති ලක්ෂණ **දෙකක්** ලියන්න.
ii. 'කලණ එන්ටප්‍රයිසස්' ව්‍යාපාරය සතු ශක්තියක් සහ දුර්වලතාවයක් නම් කරන්න.
iii. කලණ විසින් විශ්ලේෂණය කල "ව්‍යාපාර පරිසරය" යන්න නිර්වචනය කරන්න.
iv. 'කලණ එන්ටප්‍රයිසස්' ව්‍යාපාරය පෞද්ගලික සමාගමක් ලෙස ලියාපදිංචි කිරීම සඳහා අවශ්‍ය වන ලියවිලි **දෙකක්** නම් කරන්න.
v. සීමාසහිත පෞද්ගලික සමාගමක් බවට පත් කිරීමෙන් කලණට ලබාගත හැකි වාසි **හතරක්** සඳහන් කරන්න.

ව්‍යාපාරයේ ඉදිරි මාසය සඳහා ඇස්තමේන්තුගත තොරතුරු පහත දැක්වේ.

| | (රු.) |
|---|---|
| අත්පිට විකුණුම් | 500 000 |
| ණයට විකුණුම් | 300 000 |
| ද්‍රව්‍ය පිරිවැය | 240 000 |
| ශ්‍රම පිරිවැය | 90 000 |
| වෙනත් පිරිවැය | 110 000 |
| පරිපාලන වියදම් | 60 000 |
| බැංකු ණය ලබාගැනීම | 200 000 |
| මූල්‍ය වියදම් | 60 000 |
| නව යන්ත්‍රයක් මිලට ගැනීම | 300 000 |

ඉහත තොරතුරුවලට අදාළව කලණිගේ ව්‍යාපාරයේ,

vi. නිෂ්පාදන පිරිවැය ගණනය කරන්න.

vii. නිෂ්පාදන නොවන පිරිවැය ගණනය කරන්න.

viii. මාසයක් තුල ඇතුරුම් ගල් 11 000 ක් නිෂ්පාදනය කරන්නේ නම් ඒකකයක නිෂ්පාදන පිරිවැය ගණනය කරන්න.

ix. මෙම ව්‍යාපාරයේ ඇතිවිය හැකි අපේක්ෂිත ජංගම නොවන වත්කමක් හා ජංගම නොවන වගකීමක් සඳහන් කරන්න.

x. මෙම ව්‍යාපාරයේ ඉදිරි මාසය තුල දී අපේක්ෂිත ශුද්ධ ලාභය/ අලාභය ගණනය කරන්න.

**(මුළු ලකුණු $2 \times 10 = 20$)**

2.

i. නිෂ්පාදන සාධක අතුරින් ව්‍යවසායකත්ව සාධකය වඩා සුවිශේෂ වන්නේ ඇයි දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

ii. ව්‍යවසායකයෙකුට තම නිර්මාණශීලීත්වය වර්ධනය කර ගැනීමට ගතහැකි ක්‍රියාමාර්ග **හතරක්** ලියන්න.

iii. නවෝත්පාදනය සඳහා පදනම් වන මූලාශ්‍ර **හතරක්** ලියන්න.

iv. භාණ්ඩ හා සේවා අතර පවත්නා වෙනස්කම් **දෙකක්** සඳහන් කරන්න.

v. ව්‍යවසායකයන් වර්ග **දෙකක්** නම් කර, ඒ එකිනෙක වර්ගය සඳහා නිදසුනක් බැගින් දක්වන්න.

**(ලකුණු $2 \times 5 = 10$)**

3.

i. කුඩා ව්‍යාපාර ආශ්‍රිත සීමා **හතරක්** සඳහන් කරන්න.

ii. කුඩා පරිමාණ ව්‍යාපාර අසාර්ථක වීමට බලපාන හේතු **හතරක්** සඳහන් කරන්න.

iii. ව්‍යවසායකයෙකු කළමනාකරණ භූමිකාව තුළ ඉටු කරන කාර්යයන් **දෙකක්** සඳහන් කරන්න.

iv. පරිසර ප්‍රවණතා පිළිබඳව සැලකිලිමත් වීමේ වැදගත්කම පෙන්වන කරුණු **හතරක්** දක්වන්න.

v. සීඝ්‍ර වෙනස්වීම් සමඟ පුළුල් වන ව්‍යාපාර ක්ෂේත්‍රයේ දැකිය හැකි නව ප්‍රවණතා **හතරක්** සඳහන් කරන්න.

**(ලකුණු 2×5=10)**

4.

i. ව්‍යාපාර පරිසරය අධ්‍යයනය කිරීම තුළින් ව්‍යවසායකයෙකුට අත්වන ප්‍රයෝජන **හතරක්** සඳහන් කරන්න.

ii. සමන් ව්‍යාපාරයක් ආරම්භ කර පවත්වාගෙන යාමට අදහස් කරයි. ඔහු විසින් සැලකිල්ල යොමු කළ යුතු කරුණු **හතරක්** සඳහන් කරන්න.

iii. නව ව්‍යවසායකයෙකුට ප්‍රාග්ධනය සම්පාදනය කර ගත හැකි මාර්ග **හතරක්** සඳහන් කරන්න.

iv. ව්‍යවසායකයෙකුට ව්‍යාපාර අදහස් ජනනය වන මූලාශ්‍ර **හතරක්** දක්වන්න.

v. නිෂ්පාදන ප්‍රභේදනය යන්න කෙටියෙන් සඳහන් කර නිදසුනක් දක්වන්න.

**(ලකුණු 2×5=10)**

5.

i. පරිපාලන සැලැස්මක ඇතුළත් වන තොරතුරු **දෙකක්** ලියන්න.

ii. ව්‍යාපාරයක් ආරම්භ කිරීමට පෙර වියදම් **දෙකක්** දක්වන්න.

iii. හවුල් ගිවිසුමක ඇතුළත් විය හැකි එකඟතා **හතරක්** දක්වන්න.

iv. වරලත් ව්‍යාපාර ක්‍රමයේ දැකිය හැකි මූලික ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න.

v. වරලත් ව්‍යාපාර ක්‍රමය මගින් වරලත්ලාභියාට අත්පත් කරගත හැකි වාසි **දෙකක්** දක්වන්න.

**(ලකුණු 2×5=10)**

6.

i. ව්‍යවසායකත්වයට එරෙහි වන සමාජයීය සාධක **හතරක්** සඳහන් කරන්න.

ii. ව්‍යවසායකයෙකු වීමට කාන්තාවක් තුළ ඇති ශක්තීන් **හතරක්** සඳහන් කරන්න.

iii. ව්‍යාපාර ආචාරධර්ම යනුවෙන් හඳුන්වන්නේ කුමක්ද?

iv. සමාජ වගකීම පිළිපැදීමෙන් ව්‍යාපාරයකට ලැබෙන ප්‍රතිලාභ **හතරක්** සඳහන් කරන්න.

v. ව්‍යවසායකයෙකුට ලබාගත හැකි මූල්‍ය නොවන දිරිගැන්වීම් යන්න කෙටියෙන් හඳුන්වා නිදසුන් **දෙකක්** දක්වන්න.

**(ලකුණු 2x5=10)**

7.

i. මූල්‍ය සැලැස්මක අන්තර්ගත කොටස් **දෙකක්** ලියන්න. (ලකුණු 02)

ii. මූල්‍ය සැලැස්මක් මඟින් ව්‍යවසායකයාට අත්වන ප්‍රයෝජන **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02)

iii. විශාල්ගේ යෝජිත රෙදි පිළි නිෂ්පාදන ව්‍යාපාරය වෙනුවෙන් සකස් කරන ලද සැලැස්මෙහි අපේක්ෂිත තොරතුරු කිහිපයක් පහත දැක් වේ.

| **අයිතමය** | **වටිනාකම (රු.)** |
|---|---|
| විශාල් යොදවන ලද මුදල | 600 000 |
| බැංකු ණය ලබා ගැනීම | 500 000 |
| ගොඩනැගිලි කුලී ගෙවීම් | 10 000 |
| විදුලි බිල ගෙවීම් | 5 000 |
| ණයට විකුණුම් | 50 000 |
| මුදලට විකුණුම් | 150 000 |
| මහන මැෂින් මිලදී ගැනීම | 200 000 |
| අමුද්‍රව්‍ය මිලට ගැනීම | 80 000 |
| ණය ගැතියන්ගෙන් මුදල් ලැබීම් | 25 000 |
| සේවක වැටුප් ගෙවීම් | 25 000 |

ඉහත තොරතුරු ඇසුරින් ව්‍යාපාරයේ ඇස්තමේන්තු ගත මුදල් ගලා ඒම් හා ගලා යාම් ලේඛනය පිළියෙල කර මුදල් ශේෂය ගණනය කරන්න. (ලකුණු 06)

**(මුළු ලකුණු10)**

**අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය - 2025(2026) පෙරහුරු ප්‍රශ්න පත්‍රය**

**ව්‍යවසායකත්ව අධ්‍යයනය**

**1 කොටස - පිළිතුරු**

| ප්‍රශ්න අංකය | පිළිතුරෙහි අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරෙහි අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරෙහි අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරෙහි අංකය |
|---|---|---|---|---|---|---|---|
| 1. | 3 | 11. | 3 | 21. | 2 | 31. | 2 |
| 2. | 2 | 12. | 3 | 22. | 3 | 32. | 3 |
| 3. | 1 | 13. | 3 | 23. | 2 | 33. | 4 |
| 4. | 3 | 14. | 2 | 24. | 4 | 34. | 1 |
| 5. | 4 | 15. | 1 | 25. | 3 | 35. | 4 |
| 6. | 2 | 16. | 3 | 26. | 2 | 36. | 3 |
| 7. | 3 | 17. | 2 | 27. | 1 | 37. | 3 |
| 8. | 3 | 18. | 3 | 28. | 2 | 38. | 1 |
| 9. | 4 | 19. | 2 | 29. | 4 | 39. | 4 |
| 10. | 3 | 20. | 3 | 30. | 3 | 40. | 2 |